සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

10 ශ්‍රේණිය

# නාට්‍ය හා රංගකලාව - I

කාලය පැය 01 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

---

- **පහත දැක්වෙන පද්‍ය ආශ්‍රයෙන් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A මොහොතක් නවතිනු මැනවි, කුමරුනි ඔබ ඉතා දක්ෂ වූ ශිෂ්‍යයා පමණක් නොව, මා සිතට ඉතා ප්‍රිය වූ ශිෂ්‍යයා ද වේ.

B හෙළ ගැඹුරුයි පුත නොබලන් - සෙලවෙනකොට වැල් පාලම දෑස පියන් බිම නොබලන්

C ඉන්ද්‍ර දිගේ සිටිනා මරු රීරි යකා
ඉන්ද්‍ර දිගට ගියදා ලෙඩ කරයි යකා

D හිතල මතල සොයල බලලා
මව්පියො මගෙ නිසි වයසට
සරණ කරල දුන්න ස්වාමියා

01 හෙන්රි ජයසේන මහතාගේ නාට්‍ය ගීතයක් ඇතුළත් අක්ෂරය වන්නේ,
(1) D (2) C (3) B (4) A

02 දික්තල කාලගෝල නාට්‍යයට අයත් දෙබස් ඛණ්ඩය ඇතුළත් වන්නේ,
(1) D (2) C (3) B (4) A

03 මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යයක් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) A (2) B (3) C (4) D

04 ශාන්තිකර්මයකට අයත් සංවාද ඛණ්ඩය වන්නේ,
(1) B (2) C (3) D (4) A

05 සිංහල නාට්‍ය කලාවේ සංධිස්ථානයක් සනිටුහන් කළ නාට්‍යයක් වන්නේ,
(1) C (2) D (3) B (4) A

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

06 අභිනය පිළිබඳව ප්‍රථමයෙන් ම සඳහන් වූයේ,
(1) නාට්‍ය ශාස්ත්‍රයේ (2) කාව්‍ය ශාස්ත්‍රයේ (3) දස රූපකයේ (4) ගැමි නාටකයේ

07 නාට්‍ය පෙළෙහි අර්ථකථනය ප්‍රේක්ෂකයා වෙත ගෙන යාමේ දී බෙහෙවින් වැදගත් වන්නේ,
(1) අංග රචනය (2) සංගීතය (3) රූපණය (4) රංගාලෝකය

08 සරල අංග රචනය යනු,

(1) චරිතයට අනුව අංග රචනය සිදු කිරීමයි.

(2) බාහිර ස්වරූපය තිබෙන අයුරින්ම සැකසීමයි.

(3) බාහිර ස්වරූපය වෙනත් ආකාරයට රචනා කිරීමයි.

(4) නිර්මාණාත්මක ලෙස අංගරචනය කිරීමයි.

09 රූපණය යනු,

(1) චරිතයකට ක්ෂණිකව ආරූඪ වීමයි.

(2) චරිතයකට අදාළ සංවාද උච්චාරණය කිරීමයි.

(3) චරිතයකට ප්‍රවේශ වීමට ගතවන කාලයයි.

(4) චරිතයකට ආරෝපණය වී යම් කිසි කාල සීමාවක් එහි ජීවත් වීමයි.

10 නාට්‍ය බෙදෙන ප්‍රධාන ශෛලීන් ගණන,

(1) 4 යි. (2) 2 යි. (3) 3 යි. (4) 6 යි.

**● පහත සඳහන් වගුව ඇසුරින් 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| A | B | C | D | E |
|---|---|---|---|---|
| සත සහ සත | සෙක්කුව | කුවේණි | මනමේ | කදාවළලු |
| දුවැද්දෝ | වරෙන්තු | ජනේලය | සිංහබාහු | පබාවතී |
| නන්දිවිශාල | උත්තමාවී | හුණුවටය | දික්තල කාලගෝල | මනමේ |
| මුතු කුමාරි | අන්දර මල් | දිරිය මව සහ ඇගේ දරුවෝ | | වෙස්සන්තර |

11 ජාතක කතා පදනම් කරගෙන නිර්මාණ වූ නාට්‍ය ඇතුළත් වන්නේ,

(1) B (2) C (3) D (4) E

12 සුගතපාලද සිල්වාගේ නාට්‍ය ඇතුළත් වන්නේ,

(1) A (2) B (3) C (4) D

13 ජනකරලිය හා ජංගම රගමඬල ආරම්භ කිරීමට කටයුතු කළ නාට්‍යකරුවාගේ නාට්‍ය වන්නේ,

(1) A (2) B (3) C (4) D

14 මානෙල් ජයසේන රංගන ශිල්පිනිය රංගනයෙන් දායක වූ නාට්‍ය ඇතුළත් පිළිතුර වන්නේ,

(1) C (2) E (3) D (4) B

15 ශෛලිගත සම්ප්‍රදායට අයත් නාට්‍ය ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A (2) C (3) D (4) E

**● පහත දැක්වෙන රූප ආශ්‍රයෙන් 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**



A B C D E

16 හෙන්රි ජයසේන මහතාගේ හුණුවටයේ නාට්‍යයේ ගෲෂාගේ චරිතය රඟදැක්වන ලද්දේ,

(1) A (2) B (3) D (4) E

17 1978 මහාචාර්ය නෝබට් ජේ. මයර් නම් විදේශික නාට්‍යකරුවාගේ වැඩමුළුවේ අනේ අබිලික් නාට්‍යයේ රඟපෑමෙන් නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසි රංගන ශිල්පියා වන්නේ,

(1) C (2) D (3) A (4) E

18 සොඳුරු ආඥාදායකයා නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

(1) B (2) D (3) C (4) A

19 මනමේ නාට්‍යයේ මනමේ කුමාරයාගේ චරිතය රඟ දැක් වූ නළුවා වන්නේ,

(1) C (2) B (3) A (4) D

20 විකෘති නාට්‍යයේ රංගනයෙන් දායක වූ ශිල්පිනිය වන්නේ,

(1) E (2) C (3) B (4) D

21 නාට්‍ය කලාව වූ කලී සාමූහික කලාවකි. මෙම සාමූහික කලාව මෙහෙයවන පුද්ගලයා වන්නේ,

(1) පෙළ මතක්කර දෙන්නන්. (2) නළු නිළියන්.
(3) පිටපත් රචකයා. (4) නාට්‍ය අධ්‍යක්ෂක.

22 කායික සැහැල්ලුව මානසික සැහැල්ලුවට බලපාන රංග අභ්‍යාසයකි,

(1) ශිථිලකරණ අභ්‍යාසය. (2) ස්වසන අභ්‍යාසය.
(3) සංවේදන අභ්‍යාසය. (4) කටහඬ අභ්‍යාසය.

23 සූනියම් යක්ෂණියගේ අවතාර තුන අන්තර්ගත වන්නේ,

(1) රට යකුම. (2) සන්නියකුන් යාගය.
(3) කොහොඹ කංකාරිය. (4) දෙවොල් මඩුව.

24 නළුවරණය යනු,

(1) උචිත නළුවන් තෝරා ගැනීමයි. (2) නළුවන් පුහුණු කිරීමයි.
(3) නළුවන් ඉවත් කිරීමයි. (4) නළුවන් රඟපෑමයි.

25 ලෝක ධර්මී ශෛලියට අයත් නාට්‍යයක් වන්නේ,

(1) මනමේ (2) විකෘති (3) ලෝම හංස (4) සිංහබාහු

26 මිශ්‍ර ශෛලියේ නාට්‍යයකි,

(1) නරිබෑනා (2) සිංහබාහු (3) තලමල පිපිලා (4) ගුරු තරුව

27 රංග ක්‍රීඩාවක් වන්නේ,

(1) ශිථිලකරණ අභ්‍යාසය. (2) දර්පන අභ්‍යාසය.
(3) සංවේදන අභ්‍යාසය. (4) ගස් දෙකේ යුද්ධය.

28 දික්තල කාලගෝල නාට්‍යයේ සංගීත අධ්‍යක්ෂණය කරන ලද්දේ,

(1) චාල්ස් සිල්වා. (2) පුන්‍යසේන ගුණසිංහ.
(3) ප්‍රේමසිරි කේමදාස. (4) විජේරත්න වරකාගොඩ.

29 ''යෝයං ස්භාවෝ ලෝකස්ස - සුඛ දුක්ඛ සමන්විතඃ '' යනුවෙන් නාට්‍ය පිළිබඳ නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

(1) ඇරිස්ටෝටල්. (2) ධනංජය. (3) භරතමුනි. (4) බර්ටෝල් බ්‍රෙෂ්ට්.

30 නාට්‍යයක් සිනමා කෘතියකින් වෙනස් වන්නේ,

(1) එය සජීවී දෘශ්‍ය මාධ්‍යයක් නිසා ය.
(2) කලා අංග රැසක් එකතුව නිර්මාණය වීම නිසා ය.
(3) ජීවිතයේ අනුකරණයක් නිසා
(4) නළු නිළියන් විසින් රඟ දක්වන නිසා.

31 ආහාර්ය අභිනයට අයත් වේ.

(1) නාට්‍යයේ දෙබස්. (2) නළුවා ගායනා කරන ගීත.

(3) නාට්‍ය සංගීතය. (4) රංග විධාන.

32 නාට්‍ය ශෛලීන්ට අනුව රංග අලංකරණ වඩාත් සුදුසු වන්නේ,

(1) ලෝක ධර්මී ශෛලිය. (2) නාට්‍ය ධර්මී ශෛලිය.

(3) මිශ්‍ර ශෛලිය. (4) ශෛලිගත.

33 දික්තල කාලගෝල නාට්‍ය මුල්ම නිෂ්පාදනය වන්නේ,

(1) 1968 (2) 1956 (3) 1998 (4) 1975

34 දික්තලාගේ චරිතය සඳහා රංගනයෙන් දායකත්වය සැපයීමට සම්බන්ධ නොවූ රංගන ශිල්පිනිය වන්නේ,

(1) චන්ද්‍රානි පතිරණ. (2) මැණිකේ අත්තනායක.

(3) මානෙල් ජයසේන. (4) මාදනී මල්වත්ත.

35 සිංහල නාට්‍ය ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කළ නාට්‍යයක් වන්නේ,

(1) සිංහබාහු නාට්‍යය. (2) මනමේ නාට්‍යය. (3) මහාසාර නාට්‍යය. (4) රත්තරන් නාට්‍යය.

36 සරණියක් කරගන්නට - ඇවිත් නෙක නෙක තැනා
තරුණියක් දකලා එක් - නිවෙසක නැවතු නා
ඉහත ගීතය ගායනා කරන ලද්දේ,

(1) පොතේ ගුරු. (2) කාලගෝල. (3) බහු භූතයා. (4) දික් පිටියා.

- **37 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**


A


B


C

37 ඉහත රූප සටහන්වලට අදාළ පවත්වන ශාන්තිකර්ම ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,

(1) උඩරට ප්‍රදේශය. (2) සත්කෝරළය. (3) සබරගමු. (4) පහතරට.

38 A රූපසටහන්වලට අදාළ ශාන්තිකර්මය වන්නේ

(1) සන්නියකුම් යාගය. (2) සුනියම් යාගය. (3) රටයකුම. (4) දෙවොල්මඩු.

39 B රූපයෙන් දැක්වෙන නාට්‍යමය පෙළපාලිය වන්නේ,

(1) දරු නැලවිල්ල. (2) නානුමුරය.

(3) වඩිගපටුන. (4) සුනියම් යක්ෂණියගේ අවතාර.

40 C රූපයෙන් දැක්වෙන නාට්‍යමය පෙළපාලිය අයත් ශාන්තිකර්මය වන්නේ,

(1) සන්නියකුම. (2) දෙවොල් මඩු. (3) කිරි මඩු. (4) රටයකුම.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය** **නාට්‍ය හා රංගකලාව - II** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකය:

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01 ''උදේ පටන් ඇන තියාගෙන ඉඳ මට බොහොම තෙහෙට්ටුයි. බිලි බැමෙනුත් කිසිම වාසියක් උනෙත් නැහැ නොවැ.''

(i) මෙම දෙබස අයත් නාට්‍ය කුමක් ද?

(ii) මෙම දෙබස කියන්නේ කවු ද?

(iii) මෙම දෙබස අයත් නාට්‍ය සම්ප්‍රදාය හා නාට්‍ය ශෛලිය නම් කරන්න.

(iv) මෙම නාට්‍යයේ තේමාව කුමක් ද?

(v) මෙම නාට්‍යයේ කතාපුවත නිර්මාණයට පාදක කරගත් ග්‍රන්ථය කුමක් ද?

(vi) මෙහි පෙළ රචකයා කවු ද?

(vii) ඉහත නාට්‍යයේ පසුතල අලංකරණ කෙබඳු ස්වරූපයක් ගනී ද?

(viii) මෙහි පසු අධ්‍යක්ෂකවරයා නම් කරන්න. (ල. 12)

02 (i) රංග භූමිය යන්න හඳුන්වන්න. (ල. 02)

(ii) රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ 4 ක් නම් කරන්න. (ල. 04)

(iii) නූතන රංග භූමියේ මනඃකල්පිත බෙදීම් ඇඳ කොටස් නම් කරන්න. (ල. 06)

03 නාට්‍ය යනු සාමූහික ක්‍රියාවලියක ප්‍රතිඵලයකි.

(i) නාට්‍ය පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) වේදිකා නාට්‍ය කලාවේ සුවිශේෂී ලක්ෂණ 04 ක් නම් කරන්න. (ල. 04)

(iii) නාට්‍ය පෙළක් රංගනයක් බවට පත්කරන ආකාරය විස්තර කරන්න. (ල. 06)

04 (i) රූපණය යනු කුමක් ද? (ල. 02)

(ii) රූපණය පුහුණු වීමේ දී නළුවන් විසින් ප්‍රගුණ කළ යුතු අංශ 02 නම් කරන්න. (ල. 04)

(iii) රූපණ කාර්යයේ දී ශිල්පියෙකු ප්‍රගුණ කළ යුතු කුසලතා හා ගුණාංග මොනවාදැයි සාකච්ඡා කරන්න. (ල. 06)

05 (i) රංග ක්‍රීඩා හා රංග අභ්‍යාස යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? (ල. 02)

(ii) රංග ක්‍රීඩා දෙකක් හා රංග අභ්‍යාස දෙකක් නම් කරන්න. (ල. 04)

(iii) පන්තිකාමරයේ දී ඔබ විසින් සිදු කළ රංග අභ්‍යාසයක් නම් කර සිදුකරන ආකාරය විස්තර කරන්න. (ල. 06)

06 (i) පහතරට සම්ප්‍රදායට අදාළ ශාන්තිකර්ම 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) එම ශාන්ති කර්මවල නාට්‍යමය අවස්ථා එක බැගින් නම් කර ඔබ කැමති එක් නාට්‍යමය අවස්ථාවක් සිදු කරන ආකාරය විස්තර කරන්න. (ල. 04)

(iii) නාට්‍ය කලාවේ දියුණුවට පූජා කර්ම හා ශාන්තිකර්ම මගින් ලැබුණ පිටිවහල පිළිබඳ අදහස් දක්වන්න. (ල. 05)

07 දික්පිටියා සමග ඔහුගේ නිවසේ ජීවත්වන දික්තලාට කල්ගත වීමත් සමඟ දරුවන් දෙදෙනෙක් ලැබේ. මේ අතරතුර දික්පිටියා සොයා පැමිණෙන සුන්දර කාන්තාවකි. ඇය අත පුංචි දරුවකු සිටී. දරුවා දික්පිටියාගේ ඡායාරූපයක් දැක තාත්තා යයි පවසයි. මෙම සිදුවීම පාදක කොට සංවාද, චරිත, රංග විධාන හා නාට්‍යෝචිත අවස්ථා සහිතව නාට්‍ය පිටපත නිර්මාණය කරන්න. (ල. 12)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2019**

**10 ශ්‍රේණිය** **නාට්‍ය හා රංගකලාව**

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(1) | 4 -(3) | 5 -(4) | 6 -(1) | 7 -(3) | 8 -(2) | 9 -(4) | 10 -(2) |
| 11-(4) | 12 -(1) | 13 -(2) | 14 -(1) | 15 -(3) | 16 -(3) | 17 -(1) | 18 -(1) | 19 -(3) | 20 -(1) |
| 21-(4) | 22 -(1) | 23 -(2) | 24 -(1) | 25 -(2) | 26 -(1) | 27 -(4) | 28 -(2) | 29 -(3) | 30 -(1) |
| 31-(3) | 32 -(1) | 33 -(4) | 34 -(3) | 35 -(2) | 36 -(1) | 37 -(4) | 38 -(1) | 39 -(3) | 40 -(4) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

**II කොටස**

01 (i) දික්තල කාලගෝල

(ii) දික්පිටියා

(iii) නාට්‍ය ධර්මී ශෛලිය, නාඩගම් සම්ප්‍රදාය.

(iv) ස්ත්‍රියකගේ ආලය බලෙන් ලබා ගත නොහැක.

(v) උම්මග්ග ජාතකය

(vi) චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ

(vii) පසුතල රංගාලෝකය මගින් මවා පෙන්වයි.

(viii) පුන්‍යසේන ගුණසිංහ ගුරුන්නාන්සේ

02 (i) නාට්‍යයක් රඟ දක්වන ඕනෑම ස්ථානයක්

(ii) සමතලා බිමක් වීම /රඟපෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබීම /රංග ශිල්පීන්ට අවශ්‍ය අවම පහසුකම් වලින් සමන්විත වීම / ප්‍රේක්ෂකයාට පහසුවෙන් නැරඹිය හැකිවන සේ පිහිටා තිබීම.

(iii)




03 (i) නිර්වචන දෙකක් ලියා තිබීම.

(ii) සජීවී බව, සාමූහික බව, සතර අභිනය භාවිතය, රංග ශෛලියක් තිබීම, ඍජු ප්‍රේක්ෂක සහභාගීත්වය හා ප්‍රතිචාර ලැබීම / අනුෂාංගික කලා භාවිතය.

(iii) නාට්‍ය පෙළ රචනය / පෙළට අර්ථකථනයක් ලබා දීම /නළුවරණය / පෙළ කියවීම / පෙළ සාකච්ඡා කිරීම / නිෂ්පාදන පිටපත සැකසීම / නළුවන් පුහුණු කිරීම / අනුෂාංගික කලා සැලසුම් කිරීම / අලෝකය හා කාර්මික පුහුනුව / සවේෂ පුහුණුව / අවසන් පූර්ව පුහුණුවීම් වටය පැවැත්වීම / මංගල දර්ශන පැවැත්වීම

04 (i) චරිතයකට අරෝපණය වී කිසියම් කාලසීමාවක් එහි ජීවත් වීම.

(ii) අභ්‍යන්තර ප්‍රකාශනය (සිත) / භාහිර ප්‍රකාශනය (ශරීරය හා කටහඬ)

(iii) වෙහෙසීම, අමාරුකම් ගණන් නොගැනීම, දැඩි ආත්ම ශක්තිය, කැපවීම, සමූහයක් සමග වැඩකිරීමේ හැකියාව, අන්මත වලට ගරු කිරීම.

05 (i) රංග අභ්‍යාසය හා රංග ක්‍රීඩා විස්තර කර තිබීම.

(ii)

| <u>රංග අභ්‍යාස</u> | <u>රංග ක්‍රීඩා</u> |
|---|---|
| ශ්වසන අභ්‍යාස | ගස්දෙකේ යුද්ධය |
| කටහඬ අභ්‍යාස | රාක්ෂයා ගමට ඇවිත් |
| ශිථිලකරණ/සංවේදන | බල්ලා හා මස් කට්ට |

(iii) සිදුකරන ආකාරය විස්තරකර තිබීම.

06 (i) සන්නියකුම, රටයකුම, සූනියම් යාගය

(ii) සන්නියකුම - සූනියම් යක්ෂණියගේ අවස්ථාව / සන්නි පැමිණීම.
රට යකුම - නානුමුරය, කපුයක්කාරිය, දරුනැලවිල්ල. මින් එක් අවස්ථාවක් විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න.

(iii) අනුකරණය, සමාරෝපය, සංවාද භාවිතය, වේදිකාව, ප්‍රේක්ෂකයා, අනුශාංගික අංග භාවිතය ආදී ලෙසින් ලැබුණු පිටුවහල සමග කරුණු දක්වයි නම් ලකුණු දෙන්න.

07 ගැටුම් අවස්ථා / රංගවිධාන / නාට්‍යෝචිත අවස්ථා / සංවාද හා චරිත සහිතව නාට්‍යමය ආකාරයෙන් ලියා ඇත්නම් (ල. 12) යි.